## WEATHER FORECAST FOR 19 AUGUST 2019

(Issued at 05.30 a.m. on 19 August 2019)

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning since the possibility for afternoon thundershowers is high particularly in Northern, North-central, Uva and Eastern provinces.**

Showers or thundershowers will occur at Northern, Western, Central, North-western and Sabaragamuwa provinces and in Galle and Matara districts.

Showers or thundershowers will occur at several places elsewhere after 2.00 pm.

Fairly heavy falls above 75 mm are likely at some places in Northern and Eastern provinces and about 50 mm are likely at some places in Western and Sabaragamuwa provinces and in Galle and Matara districts.

සවස් කාලයේදී ගිගුරුම් සහිත වැසි ඇති වීමේ වැඩි හැකියාවක් ඇති බැවින්, විශේෂයෙන් උතුරු, උතුරු-මැද, ඌව සහ නැගෙනහිර පළාත්වල ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලිකව තද සුළං වලින් ඇතිවියහැකි බලපෑමද අකුණු මඟින් සිදුවන අනතුරුද අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

උතුරු, බස්නාහිර, මධ්‍යම, වයඹ සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සෙසු පළාත්වල තැනින් තැන සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී. 75ට තරමක තද වර්ෂාපතනයන්ද බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 50 ක පමණ තරමක තද වර්ෂාපතනයන්ද ඇති විය හැක.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 19 August 2019)

Showers or thundershowers will occur in the sea area extending from Mannar to Trincomalee via Kankasanturai and fairly heavy showers can be expected in the deep sea areas.

Showers or thundershowers will occur in the sea area extending from Puttalam to Hambantota via Colombo and Galle.

Showers or thundershowers may occur at several places in the other sea areas around the island in the evening or night.

Winds will be South-westerly and speed will be (30-40) kmph in the sea areas around the island.

The sea area extending from Hambantota to Pottuvil can be rough at times as the wind speed can increase up to 60 kmph at times and the sea area extending from Puttalam to Mullaitivu via Mannar and Kankasanturai can be fairly rough at times as the wind speed can increase up to (50-55) kmph at times.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regard.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2019 අගෝස්තු මස 19 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ගැඹුරු මුහුදු ප්‍රදේශවල තරමක් තද වැසි ද අපේක්ෂාකළ හැක.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවලද සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. 60 දක්වා ඉහල යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා මුලතිව් දක්වා මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/08/19
Time : 06.05hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)